35 වන පිටෙන්




ඊන්දිනාර්'' (පාසල් යන කාලයේ බළ සේනාවට එක්වූවා ඔහු, දුව පැන දඟ කරනා වයසේදීම තුවක්කු අතට ගත්තා ඔහු) යනුවෙන් තමන් ලියූ පද පෙළකට තමන්ම තනුවක් දමා මිහිරි ලෙසින් ගායනා කරන්නීය. ජීවිතයෙහි මහත් වූ වේදනාවන් පසුපස පැමිණි එම මාතාව තමන්ද අරගලයෙහි සටන්කාමී සහෝදරියක ලෙස සිතා කටයුතු කළාය. මට හමුවූ කාන්තා පාර්ශ්වයන් අතර ඇය මගේ සිතේ සුවිශේෂී ස්ථානයක සිටින්නීය. මොනතරම් හොඳින් වැඩ කළත් විධිමත් මූලික ආයුධ පුහුණුව ලබා නොතිබූ හෙයින් අප සම්පූර්ණ සාමාජිකාවන් ලෙස ගණන් ගන්නේ නැත. සංවිධානයේ සාමාජිකාවන් හඳුනා ගැනීමේදී ''ඔයා කීවෙනි පුහුණු කඳවුරේද?'' යන්න පළමුවෙන් අසන ප්‍රශ්නයයි. අපෙන් එම ප්‍රශ්නය අසන විට ''තවම පුහුණුව ලැබුවේ නෑ'' යැයි කීමට සිදුවෙයි. එවිට අප වෙත එල්ල වන්නේ හීනමානය ඇති කරවන බැල්මකි. එය අපට මහත් සිත් වේදනාවක් විය. අපව පුහුණුවට නොයවා රඳවාගෙන සිටින්නේ සංවිධානය විසින්ය යනුවෙන් හිත හදා ගැනීමට උත්සාහ ගත්තෙමු. මහත් ප්‍රශ්නකාරී වන්නේ රාත්‍රී කාලයයි. සෑම කෙනෙක්ම තනි තනිව මුරකාවල්වල යෙදිය යුතුය. මගේ වාරය එන්නේ බොහෝ විට මැදියම් රැයට ආසන්නයේදීය. හරිහමන් විදිහට ක්‍රියාත්මක කිරීමට පුහුණුව නොලැබූ තුවක්කුවක් වෙඩි තැබීමට සූදානම් ඉරියව්වෙන් තබාගෙන සිටිය යුතුය. කුඩා වියෙහි සිටම මා තුළ යකුන් පිළිබඳව බියක් තිබුණේ නැත. එහෙත් විශාල වෘක්ෂයන් ගන අඳුරේදී 'රීං රීං' යනුවෙන් නඟන හඬවල්ද, එක්වරම කුරුල්ලන් සහ වෙනත් වන සතුන් නඟන අමුතු හඬවල් ද, හුදකලාව ද තේරුම් ගත නොහැකි කැළඹිලි සහගත බවක් යටි බඩ ප්‍රදේශයෙහි ඇති කරන්නට විය. ඒ මදිවාට කුඩා කළ ආච්චි කියා දුන් යක්ෂ ප්‍රේත කතා ද සිහියට ඇවිත් කරදර කරන්නට විය. මා දන්නා තේවාරම්, තිරු වාසගම් ආදී ආගමික ශ්ලෝක එවිට මගේ මනසේ ගායනා වෙයි. එහෙත් මෙම බිය මගේ මනසේ හෝ හැසිරීමෙන් හෝ ප්‍රකාශ නොවිය යුතුය. බිය ප්‍රකාශ වුවහොත් මාව පුහුණුවට නොයවා සිටිනු ඇතැයි යන අදහස මා තුළ ස්වයං ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් බවට මෙම තත්ත්වය පත් කළේය. එය මට පමණක් නොව, එහි සිටි බොහෝ සටන්කාමී සහෝදරියන්ට පොදු ප්‍රශ්නයක් විය.

සෑම සිකුරාදාවකම මම වැඩ සටහන් වාර්තා භාර දීම සඳහා වවුනියාව මකිලංකුලම් හි සිට මාංකුලම්වලට පාපැදියේ කෙනෙකු නංවාගෙන යා යුතුය. විශාලව වැඩුණු කැළෑව මැද්දෙන් වූ මාර්ගයේ ගමන් කරන විට හමුදාව සැඟව සිට ප්‍රහාර එල්ල කළ හැකිය යන බිය නිසා පිටෙහි තුවක්කුව එල්ලාගෙන වළ ගොඩැලි සහිත පාරවල්වල ගොස් ඕමන්තේ ප්‍රදේශයේ දී' නවය මාර්ගයට ප්‍රවේශ වන්නෙමු. එතැන් සිට මාංකුලම් දක්වා ගොස් පසුව අභ්‍යන්තර පාරවල් ඔස්සේ අපගේ කඳවුර පිහිටි ස්ථානයට යා යුතුය. මේ අයුරින් කිලෝ මීටර් ගණනාවක් පා පැදි ධාවනය ආරම්භයේදී දුෂ්කර වුවත් ක්‍රමයෙන් එයටද හුරු වූයෙමි.

මතු සම්බන්ධයි

34 වන පිටෙන්

රාලහාමි රියදුරු මුදා හැරියා.

හාමු හාමු ...අපි ඉස්සරහට මිස පස්සට යන්න දන්නේ නෑ අනේ සමාවෙන්න හාමු අපේ රිවස් එකක් නෑ කියා ගෙන ඉගිලුනේ 1981දී. ඒ මාමයි බෑනයි ප්‍රසංගය තුලින්. බන්දුල * බැද්දගේ සුසංයෝගය ප්‍රහසනය ගීතත්වය තුල බහාලූ රස ගී සමුච්චයක් විය. වර්තමානයේ දෙසමන් බැද්ද සමගින් පරම්පරාගත සංගීත ගනුදෙනුව, සමන් ලෙනින් සමගින් ලොවට කියන්නට ඔහු සැරසෙයි.

බැද්දගේ ශූරීන් කියන්නේ කෘෂිකාර්මික ජනජීවිතය සහ බෞද්ධ දර්ශනය යනු අප ජීවත්වීමට රුකුල් දෙන මහා සාධක බවයි. ජන කතාව, ජන කවිය, ජන ශ්‍රැතිය සහ ජන සංගීතය රට පුරා අස්වැද්දුමට මේ පරිසරය වෙස්වලාගත් ආශිර්වාදයක්ම බවයි. ඔහු ගැයූ ගීත තුළින් හෝ රචනා කොට නිෂ්පාදනය කළ නාට්‍ය තුළින් හෝ වේදිකාවේ සහ ටෙලිනාට්‍යයේ රඟ පෑ චරිත තුළින් හෝ විහිදුණේ එතෙර විලවුන් සුවඳ නොව මෙරට සාමාන්‍ය ගැමියාගේ දාඩිය සුවඳයි. ඔහු නොවූයේ නම් අපේ ජන සංස්කෘතිය ජන විඥනය මෙයට වඩා ජන සමාජයෙන් ඈත් වන්නට තිබිණි.

1965 මකුළුඔලුව මහතා ජනගී සංරක්ෂණය උදෙසා එය පාසැල් විෂය නිර්දේශයට අනුබද්ධ කිරීම ජාතියට කළ උතුම් පිනක් යැයි බැද්දගේ ශූරීන් පවසයි. වීරසේන ගුණතිලක, ලයනල් රන්වල, ආනන්ද ජයසිංහ සහ බැද්දගේ ශූරීන් මේ වැඩේට පුරෝගාමිත්වය ගත්තා.

1972 ගුවන් විදුලියේ සී ද එස් කුලතිලක, පර්යේෂණ ගී පෙරලියේ වඩාත් ජනප්‍රිය වූයේ රෝහණ බැද්දගේ ගේ මගේ රත්තරන් හෙලේනා ගීතයයි. මේ ගී අන්තර්ගතයේ එන කවුද" යන්න ට හඬ අවදී කලේ වර්තමාන ජනප්‍රිය ගායක ටී එම් ජයරත්න නම් එකල්හී ආධුනික ශිල්පියා විය. ඔහුම ලියා ඔහුම සංගීතවත් කොට ඔහුම ගායනා කළ රත්තරන් හෙලේනා අසන්නන්ට නැවුම් අත්දැකීමක් විය. "කවුද"
..මගෙ රත්තරන් හෙලේනා...
මගේ රත්තරන් හෙලේනා..
මගේ හිත ගයයි.

මෙය නාට්‍යයකට නිර්මාණ වුවත් රජයේ ටෙලිග්‍රෑම් පණිවුඩයක් ස්ථාන මාරුවක් කරවයි. මාරුව ලැබුනේ හොරණ තක්ෂිලාවේ සිට අම්බලන්තොටට වීම ඉතා දුෂ්කර අභියෝගයක් විය. පොඩි එකාට මාස තුනයි කියද්දී ඊරියගොල්ල මහතා මාස තුනක් ඉඩ දුන්නා. ආයි ආණ්ඩු පෙරලි නැවත පුරුදු පරිසරයටම ආවා. එදා බැද්දගේ ශූරීන් ගැයූ කන්දේ ලන්දේ ගීතය රූප රචනා කලාවේ රූප තොර සංගීතමය රචනයේ රූප කලාවක් අසන්නාට මැවූ ගීයක් යැයි මට සිතේ. කොස්වතු කන්දේ රොසලින් නැන්දා සිටියේ ද උඩුවේ නැත්නම් බැද්දගේ ශූරීන්ගේ ගම් පියස්සේ වීම අපූරුයි.

රෝහණ සහ දයානන්ද ගුණවර්ධන එකතුවීම, රෝහණ දන්දෙණිය සමග පරාස්ස ආරම්භය, ඩගලස් සිරිවර්ධනගේ අඹු සැමියෝ උදෙසා දායකත්වය 60, 70 දශකයේ රෝහණ බැද්දගේ නම්වූ නැටුම් ගුරුවරයා නාට්‍ය ධාරාව තුල රැදවීය. දයානන්ද ගුණවර්ධනයන්ගේ ගජමන් පුවත නාටකය බැද්දගේ ශූරීන් අතින් සංගීතයෙන් රසවත් විය.

තුට කළ ලෙවන් ගුණ නැණ රුවිනි නෙක ලෙද ඉට කල
අරුත් පුවතර මා නෝන සඳ
රට තුළ සිරින් අවුරුදු මගුල් විය සොඳ
මට තුළ සතොස් නැත නුඹ නාවොතින් අද

බැද්දගේ ශූරීන් මා අභියස ගයයි.

මල් සරා බැල්ම හෙලා නම්වූ පර්යේෂණ ගීතය බිහිවෙන විට බුද්දක පැටියා අම්මාගේ කුස තුල සැඟවී හිද ඇත. බැද්දගේ ශූරීන් රස මතුකරමින් කට පලල්කර මුහුණින් අනුග්‍රහය ප්‍රකාශ කර සිනහා වෙයි. එකල්හී ආදරය විරහාවේ උල්පත් ලග සිටි ජනප්‍රිය තරු, මල් සරා සමග බැද්දගේ ශූරීන්ගේ ප්‍රාසංගික ගායනත්වයට තරමක් එදිරි වුවත් පර්යේෂණ ගී ධාරාව අතිශය ජනප්‍රිය විය. අදටත් එසේමය. අපේ සාම්පදායික පැරණි නාට්‍ය කලාවෙහි සංගීතය වෙනුවට උපයෝගී කර ගනු ලැබුවේ බෙර පදයි. ඔහු අපේ සම්මත බෙර පදවලට සීමා නොවී අලූත් බෙර පද නිර්මාණය කරයි. බෙර පද පිළිබඳ පර්යේෂණයක නියැළෙන්නෙකුට රාලහාමි නාට්‍යයේ අලූත් බෙර පද හැදෑරීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. ජන ගායනා පවතින ආකාරයෙන්ම යොදා ගැනීම ද ජන ගායනා රචනා කිරීමද රාළහාමි තුළ දක්නට ලැබේ.

අපේ ජන කවි කවදා කවුරුන් විසින් රචනා කළේ දැයි අපි නොදනිමු. රෝහණ බැද්දගේ වැනි ගැමියන් අතින් එදා ඒ කවි කියෑවෙන්නට ඇත. එසේ නම් අද අලූතෙන් ජන කවි පබැඳිය නොහැකිද? රෝහණ බැද්දගේ එම නිර්මාණ කාර්යෙහි ද නිරත වෙයි. වයසට වඩා ආත්මශක්තිය උස යැයි මට සිතේ.

උදෑසන භාවනාව බුද්ධාස්නුමතිය, යහපත් සිතුවිලි වැඩීම සහ කර□ය මෙත්ත සූත්‍රය නම්වූ බුදුරජාණන් වහන්සේ දේශනා කල සියලූ සත්වයන්ට මෛත්‍රී වැඩීමේ වටිනාකම පහදා දීමට බැද්දගේ ශූරීන් වෙහෙසෙයි. මෙම ශූත්‍රය ආරක්ෂාවට කියන පිරිතක් මෙන්ම භාවනා කර්මස්ථානයක් වශයෙනුත් හැඳින්විය හැකි බව අපට කියා දෙයි.

සකිය සගව්වට රෝදය කැරකෙනවා
දත් කැකුළට අපි කුරුණෑගල් යනවා
සකිය සගව්වට රෝදේ කැරකෙනවා
දත් කැකුළට නාරම්මල ලතැවෙනවා.

මා රංජිත්ගේ පර්ත් කුටුම්භියෙන් පිටව යා යුතු කාලය පැමිණ ඇත. බැද්දගේ ශූරීන් ගයයි ...අපිත් එකතු වේ. කරත්ත කවියක් එතුමාගේ වර්තමාන පරම්පරාවේ ජනප්‍රිය ගැයුම ලෙස මගේ කුඩා මොළේට සිතේ. කිරිපල්ල ගීතය ද දැන් රේඩියෝවෙන් ඇසේ. මහා අදුරුතුමෝ අවුරුදු කාලයට පමණක් කතා පෙට්ටිවල නොපෙනේවා. චිරං ජයතු ඔබට, ඔබ නම් තැබූ ඩිංගි රාළ පිටත් වුනා.

**සකිය සගව්වට රෝදේ කැරකෙනවා**
**සසඳ සසඳ අපි මහා පාරේ යනවා.**

Alpha Academy 2017
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

To request an application,
please text student name, Class and school to
0457908918

JAPANESE
By a qualified experienced teacher
with proven results

PREP to VCE

- Rapid Learning Strategies
- Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
- Exam Revision and Preparation for VCE written and oral exam.

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship
to teach Japanese language.

Contact Number: 0425 396 975